ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/20 |

| | | | |
|---|---|---|---|
| පැමිණිලිකරු | : | | ඩබ්. ප්‍රියංගිකා මිය,<br>ගොඩපරහේන, වරකාගොඩ,<br>නෑබඩ. |
| වින්දිත පාර්ශවය | : | | එම්. ජී.දිනේන්ද්‍ර කුමාර, |
| වගඋත්තරකරුවන් | : | 01. | එච්. ඩබ්. උදයංග මයා,<br>පාසල් මුරකරු,<br>බප/හො/වරකාගොඩ මහා විද්‍යාලය,<br>වරකාගොඩ. |
| | | 02. | විදුහල්පති,<br>බප/හො/වරකාගොඩ මහා විද්‍යාලය,<br>වරකාගොඩ. |
| | | 03. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කළාප අධ්‍යාපන කාර්යාලය,<br>හොරණ. |

<u>පැමිණිලි අංක : HRC/1239/16/I-23</u>

<u>පැමිණිල්ල :</u>

පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇත්තේ බප/හො/වරකාගොඩ මහා විද්‍යාලයේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ එම්. ජී. දිනේන්ද්‍ර කුමාර නැමැති තමාගේ දරුවා හට පාසලේ මුරකරු වන පලවන වගඋත්තරකරු විසින් 2016.03.09 දින පහරදීමක් සිදු කර ඇති බවත්, එයට හේතු වී ඇත්තේ කැමරාවක් සොරකම් කිරීම සම්බන්ධව සැක පිට බවත්, එදින සිදු වී ඇත්තේ තමාගේ දරුවා ඇතුලු තවත් සිසුන් 07 දෙනෙක් පාසලේ තොරතුරු තාක්ෂණික කාමරය වෙත ගොස් ඇති අතර, පසුව එය භාර ගුරුතුමිය විසින් තමාගේ පුතාට කැමරාව දී



| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 |
| ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | | |

පින්තූර කීපයක් රැගෙන එන ලෙස පවසා ඇති බවයි. ඉන්පසු දරුවා පින්තූර රැගෙන නැවත කැමරාව ගුරුතුමිය වෙත ගෙනවිත් දුන් විට එය කවරයට දමා ගුරුතුමිය පෙන් වූ ස්ථානයේ තබා ඔවුන් නැවත පන්ති කාමරයට ගොස් ඇති බවත්, නැවත 6 වන කාලපරිච්ඡේදයේදී තමාගේ දරුවා ඇතුලු තවත් 07 දෙනෙකු තොරතුරු තාක්ෂණ කාමරය වෙත කැඳවා ඇත්තේ කැමරාව නැති වූ බව පවසමිනි. ඉන්පසු ඔවුන් සියලු දෙනාම එකතු වී කැමරාව සොයා, එම තොරතුරු තාක්ෂණ කාමරයේ නොමැති නිසා තමාගේ දරුවා ඇතුලු අනිකුත් දරුවන්ගේ බෑගයද පළමුවර පරීක්ෂා කර ඇති නමුත්, එය හමුවී නැත. නමුත් දෙවන වරද දරුවන්ගේ බෑග් පරීක්ෂා කර ඇති අතර, එහිදීද කැමරාව සොයා ගත නොහැකි වූ බවත්, පසුව පාසලේ මුරකරු වන එච්. ඩබ්. උදයංග නැමැත්තා තාක්ෂණ කාමරය තුළට පැමිණ සිසුන්ට රණබට මගින් පහරදී ඇති බවත්, ඒ අවස්ථාවේ තාක්ෂණ ගුරුතුමිය සහ ප්‍රධාන ශිෂ්‍ය නායකයාද සිටි බවත් වැඩිදුරටත් දක්වා ඇත. පාසලේ සිටින අනෙක් මුරකරු සහ ප්‍රධාන ශිෂ්‍ය නායකයාද ඉදිරිපිට එච්. ඩබ්. උදයංග (පාසලේ දිවා මුරකරු) සිසුන්ට පහරදී ඇති බවත්, දෙවරක් පරීක්ෂා කර නොතිබූ කැමරාව තෙවන වර දරුවාගේ බෑගයේ තිබී හමුවී ඇති බවත්, කැමරාව ලැබුණු පසු තොරතුරු තාක්ෂණ ගුරුතුමිය ඉදිරිපිටදීම මුරකරු විසින් තමාගේ දරුවාට පහරදී ඇති බවත්, ඉන්පසුව විදුහල්පතිතුමා ළඟට රැගෙන ගොස් ඇති අතර, පසුව තමාගේ දරුවාට සහ අනික් දරුවාට ගෙදර යන ලෙස දන්වා ඇත. කඩේ අසලදී පහර කෑමට ලක් වූ සිසුන් දෙදෙනෙක් විසින් සිද්ධිය සම්බන්ධයෙන් පවසන විට තමා එතැනට ගොස් විමසූ විට තම දරුවාට තවමත් පහර දෙන බව පැවසූ අතර, තමා පාසලට යන විට දරුවා පාසලෙන් පිටතට පැමිණ තිබුණු බවත්, තමාගේ දරුවාට සිදු කළ මෙම අගතිය හේතුවෙන් තම දරුවාගේ අධ්‍යාපනයටද බාධා ඇතිවූ බවත් ප්‍රකාශ කර සිටී.

<u>පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

මෙම සිදුවීම සම්බන්ධයෙන් පලවන වගඋත්තරකරු වන පාසලේ දිවා මුරකරු එච්. ඩබ්. උදයංග පෙරේරා යන අයගෙන් විමසූ විට ප්‍රකාශ කරන ලද්දේ අදාළ කැමරාව පිළිබඳව සොයා බැලීමේදී කිසියම් නොසන්සුන්තාවයක් හටගත් බැවින්, අදාළ ස්ථානයට ගොස් ශිෂ්‍ය නායක රවිහංස කල්හාර පාසල් බෑග් පරීක්ෂා කරන අතරතුර, වින්දිත එම්. ඒ. දිනේන්ද්‍ර කුමාර සිසුවා පාසල් බෑගයක් රැගෙන පරිගණක ඒකකයෙන් පිටව යාමට උත්සාහ දැරූ බව තමන් දුටු බවත්, එවිට දිවා මුරකරු වන තමා විසින් මෙම පැමිණිලිකාරියගේ දරුවාගේ බෑගය පරීක්ෂා කළ බවත්, එහි තිබී කැමරාව හමු වූ බව කරුණු දක්වා ඇත. ඒ පිළිබඳ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රකාශ සටහන් කළ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

<u>දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

දෙවන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයේ පරිගණක ඒකකය තුළ තිබූ ඩිජිටල් කැමරාව නැතිවී ඇති බවත්, පරිගණක ඒකකය භාරව කටයුතු කරන ජේ. එන්.

උදයංගනී මෙනවිය සහ කේ. අයි. ඩී. එම්. හේවාවිතාරණ මෙනවිය දිවා විවේකයෙන් පසු පරිගණක විද්‍යාගාරයට යනවිට එහි තිබූ ඩිජිටල් කැමරාව නැතිවී ඇති බව දැනගැනීමෙන් පසු එම ස්ථානයේ සිටි සියලු දරුවන්ගෙන් සහ අදාළ ගුරුභවතුන්ගෙන් මේ පිළිබඳව විමසීම් කළ බවත්, එහෙත් කැමරාව පිළිබඳ කිසිදු තොරතුරක් දැනගැනීමට නොහැකි වූ හෙයින් ප. ව. 12.45 ට පමණ තමා වෙත දැනුම් දුන් බවත්ය. ඉන්පසු තමා සහ නියෝජ්‍ය විදුහල්පති ඇතුලු තවත් ගුරු භවතුන් කීපදෙනෙක් පරිගණක විද්‍යාගාරයට ගොස් සිදුවීම සම්බන්ධයෙන් එහි රැඳී සිටි 9 ශ්‍රේණියේ සිසුන්ගෙන් විමසූ අතර, නිශ්චිත තොරතුරක් සොයා ගැනීමට නොහැකි වූ බවත්ය. ඒ අතර ප්‍රධාන ශිෂ්‍ය නායක විසින් කැමරාව සෙවීමේ කාර්යෙහි නිරත වී සිට ඇති බවත්, පාසලේ දිවා මුරකරු වන එච්. ඩබ්. උදයංග පෙරේරා යන අයවද මේ පිළිබඳව දැනුවත් කළ බවත්,

ඉන් අනතුරුව පෙර යොදා ගත් පරිදි මාසික ගුරු සාකච්ඡාව පැවැත්වීම ආරම්භයේදීම මෙම සිදුවීම පිළිබඳව දැනුවත් කළ බවත්, ඒ අතරතුර 9 ශ්‍රේණියේ දරුවන් කීපදෙනෙක් පැමිණ කියා සිටියේ එම්. ඒ. දිනේන්ද්‍ර කුමාරගේ පාසල් බෑගයේ තිබී කැමරාව හමු වූ බවයි. එහිදී පරිගණක ඒකකය භාර ගුරුභවතුන් දෙදෙනා අදාළ ස්ථානයට ගොස් කැමරාව ඔවුන් භාරයට ගෙන ඇත. ඒ අනුව විනය කමිටුවේ තීරණය අනුව වින්දිත එම්. ඒ. දිනේන්ද්‍ර කුමාර සිසුවාටත් ඔහුගේ දෙමාපියන්ටත් විනය කමිටුවට පෙනී සිටින ලෙසත්, මෙය වැරදි ක්‍රියාවක් බව පහදා දෙමින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොකරන ලෙසටත් සිසුවාට අවවාද කරන ලද බවත් දක්වා ඇත.

තවද, මේ අතරතුර 2016.03.09 දින ප. ව. 6.00 ට පමණ තෙඹුවන පොලිස් ස්ථානය මඟින් දුරකථන ඇමතුමක් ලබා දී ප්‍රකාශ කරන ලද්දේ පාසලේ දිවා මුරකරු ලෙස සේවය කරන එච්. ඩබ්. උදයංග පෙරේරා යන අයට විරුද්ධව පැමිණිල්ලක් අදාළ දරුවාගේ දෙමාපියන් සිදු කර ඇති බවත්, ඒ අනුව තමා විසින් ඉතා ඉක්මණින් බුලත්සිංහල කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහ කළාප අධ්‍යාපන කාර්යාලයේ පාසල් පරිපාලන අධ්‍යක්ෂතුමියද දුරකථනයෙන් දැනුවත් කරන ලද බවත්, එදින රාත්‍රී 8.30 ට පමණ එච්. ඩබ්. උදයංග පෙරේරා යන අයව තෙඹුවන පොලිස් ස්ථානයට ගොස් භාර දීම සිදු කළ අතර, ඒ සඳහා බුලත්සිංහල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, පාසලේ නියෝජ්‍ය විදුහල්පතිතුමා හා නියෝජ්‍ය විදුහල්පතිතුමිය සහභාගී වන ලද බවත්,

පසුව 2016.03.10 දින පෙ. ව. 9.00 ට නැවත පාසල් විනය කමිටුව රැස්වී ජේ. එන් උදයංගනී මෙය සහ කේ. අයි ඩී. එම්.හේවාවිතාරණ මෙය (පාසල් පරිගණක ඒකකය භාර ආචාර්යවරියන්) සහ පී. ඩී. මිරාන් මනුෂ සහ එච්. ඩී. මිපීල සාරාංග (මෙම කැමරාව සොයා ගන්නා විට එම ස්ථානයේ සිටි සිසුන්) රවිහංස කල්හාර (බෑග් පරීක්ෂාව තුළින් කැමරාව සොයා ගත් ශිෂ්‍ය නායකයා) යන අයවළුන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලද බවත්, මෙහිදී පාසලේ මුරකරු වන එච්. ඩබ්. උදයංග යන අය අත්අඩංගුවේ සිටි නිසා වින්දිත

එම්. ඒ. දිනේන්ද්‍ර කුමාර සිසුවා පාසල් නොපැමිණි නිසා ප්‍රකාශ ලබා ගැනීමට නොහැකි වූ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

විනය කමිටුවේ නිර්දේශය වූයේ මෙම සිද්ධියට අදාළව ගුරුභවතුන්ගෙන් හා දරුවන්ගේ ප්‍රකාශවලින් පැහැදිළි වන්නේ වින්දිත දිනේන්ද්‍ර කුමාර සිසුවා පාසලේ කැමරාව ගත් බවත්, මෙය විනය විරෝධී ක්‍රියාවක් වුවත්, ඒ පිළිබඳ දරුවාට මානසික පීඩාවක් ඇති නොවන ආකාරයෙන් හා අධ්‍යාපන කටයුතුවලට බාධාවක් නොවන ලෙස වරද පෙන්වා දී ඒ පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම ප්‍රමාණවත් බවත් නොකඩවා දරුවාට පාසල් පැමිණෙන ලෙස දැන්වීමක් කිරීම සුදුසු බවයි.

2016.03.10 දින සවස එච්. ඩබ්. උදයංග (මුරකරු) මතුගම මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඇප ලබා දුන් අතර, නඩුව සමථ මණ්ඩලය වෙත යොමු කර ඇත. එදිනම හොරණ කලාප අධ්‍යාපන කාර්යාලයට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන ලෙසට දැනුම් දුන් අතර, 2016.03.11 දින දිවා මුරකරු එච්. ඩබ්. උදයංග පෙරේරා සේවයට වාර්තා කල අතර, පාසල් විනය කමිටුව විසින් ඔහුගේද ප්‍රකාශ සටහන් කර ගන්නා ලද අතර, අදාළ පාර්ශවයන්ගෙන් ප්‍රකාශ මඟින් දරුවාට කිසිදු පහරදීමක් සිදුවී ඇති බවට තහවුරු වී නොමැති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

2016.03.16 දින වින්දිත එම්. ඒ. දිනේන්ද්‍ර කුමාර සිසුවාගේ දෙමාපියන් විසින් ලිපියක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටියේ තම දරුවා පාසලෙන් අස්කර ගැනීමට අදාළ ලියවිලි ලබා දෙන ලෙස බවත්, එහිදී මවට කරුණු පැහැදිළි කර දුන් නමුත්, එයට එකඟ නොවීම හේතුවෙන් ඔවුන්ගේ ඉල්ලීමට අනුව අස්වීම ලබා දෙන බවත්, මෙම සිදුවීමට අදාළ හොරණ කළාප අධ්‍යාපන කාර්යාලය විසින් පරීක්ෂණයක් සිදු කරන අතර, අදාළ සියලු පාර්ශවයන්ගෙන් ප්‍රකාශ සටහන් කර ඇත. එච්. ඩබ්. උදයංග පෙරේරා (දිවා මුරකරු) බප/හෝ/පාතකඩ කණිෂ්ඨ විද්‍යාලයට ස්ථාන මාරුවක් ලබා දී ඇති බව දක්වා ඇත.

<u>තෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම.</u>

තෙවන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ අදාළ පාසලේ පරිගණක විද්‍යාගාරයේ තිබූ ඩිජිටල් කැමරාව අස්ථාන ගත වී ඇති බවත්, පරිගණක අංශය භාර ගුරුවරිය විසින් දැනුම්දීමෙන් අනතුරුව පාසලේ ශිෂ්‍ය නායක රවිහංස සිසුවා සහ පාසැල් මුරකරු එච්. ඩබ්. උදයංග යන අය විසින් නැති වූ කැමරාව 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබා වින්දිත දිනේන්ද්‍ර කුමාර සිසුවාගේ පාසැල් බෑගයේ තිබී සොයා ගෙන ඇති බවත්,

ඒ අවස්ථාවේ මුරකරු විසින් මෙම සිසුවාට අමානුෂික ලෙස පහරදී ඇති බවත්, එමනිසා දරුවාව වෛද්‍ය ප්‍රතිකාර සඳහා හොරණ මූලික රෝහලට ඇතුළත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තෙඹුවන

පොලීසිය වෙත පැමිණිලි කර ඇති බවත්, ඒ අනුව මූලික විමර්ශනයක් පවත්වන ලද බවයි. මෙම සිද්ධියට අදාළ සියලු පාර්ශවයන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලද බව දක්වන ලදී.

<u>නිරීක්ෂණ</u> :

පාසලේ තිබූ ඩිජිටල් කැමරාවක් අස්ථානගත වීමක් සිදු වී ඇති බවද, ඊට අදාළව පාසලේ ළමුන් ඇතුලු ගුරුවරුන් හා මුරකරුවන් සොයා බැලීම් කළ බව අදාළ ප්‍රකාශ අධ්‍යයනයේදී කරුණු නිරීක්ෂණය වේ.

- එහිදී පලවන වගඋත්තරකරු එම ඩිජිටල් කැමරාව සොයා බැලීමට සම්බන්ධ වී ඇති බව නිරීක්ෂණය වන අතරම, තෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම අනුව මෙම සිද්ධියට අදාළව කළ පරීක්ෂණයේදී පලවන වගඋත්තරකරු තම සීමාව ඉක්මවා කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බව දක්වා ඇත.

- තවද, වින්දිත දිනේන්ද්‍ර දරුවා වෛද්‍ය ප්‍රතිකාර සඳහා **2016.03.09** දින පස්වරුවේ හොරණ මූලික රෝහලට ඇතුළත් කර ඇති අතර, **2016.03.10** දින ඔහු රෝහලෙන් පිටව ගොස් ඇත. ඒ අනුව මෙම දරුවාට අදාළව අධිකරණ වෛද්‍ය වාර්තාව සලකා බැලීමේදී එහි ලබා දී ඇති රෝග ඉතිහාසයේ දක්වා ඇත්තේ "උදේ ස්කෝලේදී මට වෙනුක බටයකින් ගැහැව්වා" යන්නයි. එහි අධිකරණ වෛද්‍යවරයා විසින් පහත තුවාල ඇති බව දක්වා ඇත.

01. 3 cm x 2 cm සමාන වූ සීරීමක් කලවේ පිටුපස
02. 3 cm x 1 cm තැලීම් තුවාලයක් කකුල පිටුපස
03. 6 cm x 1cm තැලීම් තුවාලයක් කකුල පිටුපස
04. 3cm x 1cm තැලීම් තුවාලයක් කකුලේ පිටුපස

- එසේම, එම තුවාල මොට ආයුධයකින් සිදු කළ තුවාල බවද තහවුරු වන බව දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය දක්වා පහර දුන් ආකාරය හා මෙම තුවාල සැසඳෙන බව කරුණු නිරීක්ෂණය වේ.

- **2016.03.14** දින විමර්ශන කමිටු නිලධාරියකු වන හොරණ කළාප අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරී විසින් පරීක්ෂා කරනු ලැබ ඇති අතර, එම සීරීම් කැළලි දණහිසෙන් පහල සිරස් අතට තිබූ සීරීම් තුවාල බවත්, පහරදීමකදී ඇති විය හැකි තිරස් තුවාල ඔහුගේ කකුලේ තිබූ බවට ඇයගේ දැනීමේ හැටියට තහවුරු කළ නොහැකි බවයි.

- එසේම, මෙම පලවන වගඋත්තරකරු මෙම වින්දිතට අනිකුත් සියලු සිසුන් එකතු වී පහර දුන් බවට කරුණු දැක්වුවද, එම පහර දුන් ආකාරය අධිකරණ වෛද්‍ය වාර්තාවේ දැක්වෙන තුවාල හා සැසඳීමක් නොවේ. නමුත් පලවන වගඋත්තරකරුගේ පමණ ඉක්මවා කටයුතු කිරීම වධහිංසාවක් කිරීම බව අදාළ කරුණු විශ්ලේෂණයේදී නිරීක්ෂණය වේ.

- මෙම සිද්ධියට අදාළ දරුවාව වරකාගොඩ මහා විද්‍යාලයෙන් අස්කරගෙන ගොස් වෙනත් පාසලකට ඇතුළත් කර ඇත. හොරණ කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විනය කටයුතුවලට යටත්ව මුරකරු පාතකඩ කණිෂ්ඨ විද්‍යාලය වෙත ස්ථානමාරු කර ඇති බවත්, නිරීක්ෂණය වේ.

- මෙම මුරකරු සිය රාජකාරී විෂය සීමාව ඉක්මවා කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වන බැවින් මූලික විමර්ශනයකට යටත්ව ඔහු වෙත දැනටමත් ස්ථානමාරුව ලබා දී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

- තවද මෙම සිද්ධියේදී වගකිවයුතු ගුරුවරුන් පාසලේ සිටියදී විදුහල්පති විසින් මුරකරු වෙත වගකීම පවරා ඇති බැවින් මුරකරු තම විෂය සීමාව ඉක්මවා කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

- ගුරුවරයා දෙමාපියන් වෙනුවට පාසල් ශිෂ්‍යයින් සම්බන්ධයෙන් ගුරුවරයා ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් නම් වූ නීතිමය සංකල්පය සැළකිල්ලට ගෙන, සැමවිටම දෙමාපියන් හා දරුවන් තමා වෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම හා දෙමාපිය භාරකරුවන් කෙරෙහි දරුවන්ගේ විශ්වාසනීයත්වය තහවුරු වන ආකාරයට කටයුතු කිරීමට දක්වා ඇත. ඒ අනුව පාසලේදී දරුවන්ගේ ආරක්ෂාවේ වගකීම සෘජුවම විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට පැවරේ. ඒ අනුව එම වගකීමෙන් මිදීමේ කිසිදු හැකියාවක් විදුහල්පතිට හෝ ගුරුවරුන්ට නොහැකි වේ.

නිගමනය :

උක්ත කරුණු අනුව වින්දිත වන එම්. ඒ. දිනේන්ද්‍ර කුමාර යන අයවළුන් සම්බන්ධව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය මඟින් තහවුරු කරන ලද 11 ව්‍යවස්ථාව වන වධහිංසාවන්ගෙන් මිදීමෙන් අයිතිය මෙන්ම 12 (1) ව්‍යවස්ථාවේ නීතියේ රැකවරණය උල්ලංඝනය වී ඇති බව මෙයින් නිගමනය කරමු.

නිර්දේශය :

01. ඒ අනුව පලවන වගඋත්තරකාර වන වෙනුක උදයංග යන අය විසින් මෙම අගතියට පත් පාර්ශවය වෙත රු: 10000/- (දහදාහක) මුදලක් ගෙවීමට කටයුතු කළයුතුයි.

02. තවද, පලවන වගඋත්තරකාර පාර්ශව මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට මෙම නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කරනු ලැබේ.

03. විදුහල්පතිවරුන් හා ගුරුවරුන් 12/2016 චක්‍රලේඛනය හා 2012/37 චක්‍රලේඛනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර, ඒ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැන්වීම.

2022. 02. 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුෂියා ෂන්මුගනාදන්
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

සැ.යු. : අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලබාදීමට සැලැස්විය යුතුය.